

# ඩිජිටල් සම්පත් පැතිකඩ

## Digital Resource Profile





වයඹ අභිමානය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව



වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

- දැක්ම -

" පහසුකම් සපිරි
යහපාලිත පුරවරයක් "

- මෙහෙවර -

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ
ජනතාවගේ ජන ජීවිතය නංවාලීම උදෙසා පහසුකම්
සපයමින්......
සභාව සතු සම්පත් හා අනෙකුත් ආදායම්, ආධාර
යහපාලනයෙන් යුක්තව, කාර්යක්ෂමව, ඵලදායීව
කළමණාකරණය කර පුළුල් ජනතා සහභාගිත්වයකින්
උපරිම සේවාවක් සැපයීම
අපගේ මෙහෙවර වේ.....

වයඹ අභිමානය

CHAIRMAN - K.V.SUSANTHA PERERA
077 7783814

SECRETARY W.D.LUCIAN
077 0830642 / 070 2749873

OFFICE
031 2255276 - 031 2255379
wennappuwaps@gmail.com
031 2253249

GIS OFFICER - K.J.P.S.S.FERNANDO
077 7705431
M.G.T.K. FERNANDO
076 0365175

# ඩිජිටල් සම්පත් පැතිකඩ

## Digital Resource Profile

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය

## ඩිජිටල් සම්පත් පැතිකඩක නිර්මාණය කිරීම

වර්තමාන රාජ්‍ය සේවයට නවීන තාක්ෂණයේ දායකත්වය උපරිමයෙන් ලබා දීමේ අරමුණ ඇතිව මෙම සම්පත් පැතිකඩ නිර්මාණය කර ඇත. මේ සඳහා වැඩි වශයෙන් භූගෝලීය තොරතුරු තාක්ෂණය භාවිතා කර ඇති අතර ඊට අමතරව වෙනත් තාක්ෂණික මෙවලම් ද අවශ්‍ය පරිදි ඇතුළත් කර ඇත.

පරිශීලකයාට මෙම මුද්‍රිත පිටපත මගින් සාමාන්‍ය අවබෝධයක් ලබාගත හැකි පරිදි නිර්මාණය කර ඇතත් යම් ක්ෂේත්‍රයක් පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය අයට මෙහි ඇති QR කේත භාවිතා කර වැඩි විස්තර ලබා ගැනීමේ හැකියාව පවතී.

වර්තමානයේ මුද්‍රණ වියදම ඉතා අධික වන අතර මෙහි අඩංගු සියලුම තොරතුරු මුද්‍රණය කිරීමට පිටු 1000 කට අධිකව අවශ්‍ය වේ. එම වියදම ඉතාම අවම මට්ටමට ගෙන ඒමට බොහෝ තොරතුරු මෘදු පිටපත් ආරක්ෂාකාරීව නිර්මාණය කර ඊට අවශ්‍ය කේතයන් මුද්‍රිත පිටපත් අයුරින් පොත තුළ මුද්‍රණය කර ඇත.


මෙම නිර්මාණය තවමත් පර්යේෂණ මට්ටමේ පවතින අතර නියමු ව්‍යාපෘතියක් ලෙස වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක කිරීමට ලැබීම භාග්‍යයකි. මේ සඳහා සම්පත් දායකත්වය ලබා දුන් වයඹ පළාත් භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකයට හා ඊට අනුබද්ධ නාරම්මල, කුලියාපිටිය, කල්පිටිය හා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවල භූගෝලීය තොරතුරු තාක්ෂණ ඒකකවල නිලධාරීන්ට ප්‍රශංසාව හිමි විය යුතුය.

එම්.එම්.එස්.ප්‍රේමචන්ද්‍ර
විමර්ශන නිලධාරී
පළාත්පාලන දෙපාර්තමේන්තුව (වයඹ)

# <u>වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටීම</u>

වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ බටහිර හා දකුණු මායිම්ව පිහිටා ඇති වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මහා සාගරයට මායිම් වී ඇත. උතුරට නාත්තන්ඩිය බල ප්‍රදේශයත් නැගෙනහිරට උඩුබද්දාව උන්නතාංශය අනුව මීටර් 0 සිට මීටර් 70 දක්වා භූගෝලීය ව්‍යාප්තියක් දක්නට ඇත. මීටර් 0 සිට 10 දක්වා වන ප්‍රදේශය නිතර ගංවතුර ආපදාවන්ට ලක්වන ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකි අතර මීටර් 60 ට වැඩි ප්‍රදේශ කිහිපයක් ඇති අතර ඒවා සුනාමි අවධානම් තත්ත්වයකදී වුවද ආරක්ෂිත ප්‍රදේශ ලෙස හඳුන්වා දිය හැකිය මුහුදු මට්ටමේ සිට මීටර් 500 ක් දක්වා දුරට වන ප්‍රදේශ වැඩිපුර සුනාමි ආපදාවට ලක්විය හැකි බැවින් මෙම ප්‍රදේශය සුනාමි අනතුරු සංඥා කුළුනක් ද සවිකර තිබේ.

# HAZARD AREA IN WENNAPPUWA PS AREA & ASSEMBLING PLACES



# වෙන්නප්පුව ග්‍රාම නාමය

වෙන්නප්පුව නමින් මේ ගම හැඳින්වීම පිලිබඳව මතිමතාන්තර කිහිපයක්ම වෙයි.සමහරුන්ගේ මතය වනුයේ මෙහි විසූ වන්නියාර් වරයෙකු නිසා වෙන්නප්පුව යන නම ඇතිවූ බවයි.ඉතිහාසයේ දැක්වෙන කරුණු අනුව වන්නි 18ක් සඳහා 'වන්නියාර්' නම් ප්‍රාදේශීය පාලකයන් පත්කර ඇත.මේ 18 දෙනාට අමතරව මීගමුව තොප්පුතොටුපලේ සිට කුදිරමලෙයිකන්ද දක්වා වූ ප්‍රාදේශීය පාලනය සඳහා තවත් වන්නියාර්වරු 5 දෙනෙක් වූහ.මෙකී වන්නියාර්වරුන්ගෙන් කෙනෙකු වෙන්නප්පුව ගම් සීමාවේ පදිංචි වූ බව කියවේ.වෙන්නප්පුව වැවට නැගෙනහිරින් මාටින් ද පෝරස් මාවත අසල පිහිටි මාලිගාවත්ත නමින් ව්‍යවහාර වන බිමේ පැරණි රාජකීය ගොඩනැගිල්ලක නටබුන් අදද දක්නට ලැබේ. මේ නටබුන් අතර වැළලී ගිය ගල්කණු ,සෙල් මුවා අඩිතාලම් ,ඉපැරණි පැතලි උළු හා ගඩොල් ආදිය හමුවේ. ඉහත කී වන්නියාර් වාසය කලේ මේ ස්ථානයේ බවටත් ඒ අසලම ඇති පතහ ඔහුගේ නාන පොකුණ වශයෙන් පරිහරණය කළ බවටත් කටකතා ඇත.වන්නියාර් විසූ පුරය වන්නියාර්පුර ලෙසත් එය පසුව වෙන්නපුර වෙන්නප්පුව ආදි සැටියෙන් වෙනස් වූ බවත් ඔහුගේ අදහසයි.

නාම නාමය සම්බන්ධව තවත් මතයක් වී ඇත්තේ විෂ්ණු දේවාලය යන අර්ථයෙන් වෙන්නප්පුව කියා නම් කරුණ බවයි. ඒ පිළිබඳ පුවත මෙසේය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති ලියවිල්ලකින් උපුටා පළ කළේ යැයි කියන 'මුක්කර සටන' නමැති ලිපියක මේ ප්‍රදේශයේ වරක මුක්කර වර්ගයා පදිංචිව සිටි බවක් දැක්වේ. ශිව භක්තිකයන් වූ මොවුන්ගේ එක් බලවත් අධිපතියකු විසින් දැනට කිඹුල්ගාල නමින් හැඳින්වෙන ගින් ඔය වක්‍රව ගලා යන උතුරු නැගෙනහිර කොනේ ශිව හෙවත් විෂ්ණු දෙවියන් වෙනුවෙන් දෙවොලක් ඉදි කරනු ලැබූ බවත් එම දෙවොලේ නටබුන් තවමත් දක්නට ඇති බවත් සමහරු කියති. ඔවුන්ගේ මතය වනුයේ වෙන්නප්පුව පුරාවෘත්තය මේ විෂ්ණු දේවාලයෙන් ඇරඹෙන බවයි. විෂ්ණු දෙවියන්ට කැප වූ ප්‍රදේශය විෂ්ණු පුරය හෙවත් වෙණුපුර විය.වෙණුපුර වෙන්නප්පුව විය. එසේත් නැතිනම් මුක්කර අධිපතියා තම නිලනාමයෙන් හෝ විෂ්ණු දෙවියන්ට දෙමළෙන් කී නම අනුව හෝ වෙන්නාර්පුරම් වෙන්නාර්පූර් යනුවෙන් වෙනස් වී පසු කාලෙක වෙන්නප්පුව කියා පද පෙරළුණ බවයි.

වරුණ නමැති ප්‍රධානියකු මෙහි පදිංචි වීම නිසා ඔහු නමින් වර්ණපුර යනුවෙන්ද එය පසුව වෙන්නපුර වී එයිනුත් අනතුරුව වෙන්නප්පුව වූ බවට තෙවැනි මතයක් ද වෙයි.

පුත්තලම ප්‍රදේශයේ මිනිසුන් තලා පෙළා හිරිහැර කරමින් වස්තු කොල්ලකමින් සිටි මුතු ක්‍රිස්ණා නම් දෙමළ ප්‍රධානියකුගේ අනුගාමිකයකු වන වන්නම්පොන්නේ නැමැත්තා වෙන්නප්පුවේ පදිංචි සිටි බවත් ඔහුගේ නමින් වෙන්නප්පුව යයි මේ ගමට නම යෙදුණු බවත් සිව්වැනි මතයකින් දැක්වේ. මේ කියන මුතු ක්‍රිස්නා ගැන කෝට්ටේ රජ කළ ධර්මපරාක්‍රමබාහු රජතුමා විසින් (1591- 1597) මොළගොඩ දුක්ගන්නා හිටි බණ්ඩාර කුමරුට ප්‍රදානය කරන ලදුව කිරි වත්තේගම ශ්‍රී සන්නස් ලියන මොහොට්ටාල විසින් ලියන ලද සන්නසේ සඳහන් වෙයි. මේ හැරුණු විට ග්‍රාම නාමය සම්බන්ධයෙන් තවත් මත කීපයක් වෙනත් ඒවා එතරම් වැදගත් යයි නොපෙනෙන හෙයින් මෙහිලා සඳහන් නොකෙළෙමු.

ගමේ ආරම්භය අදට අවුරුදු 800 කටත් වඩා වැඩි වුවද මුලදී මේ ගම වෙන්නප්පුව නමින් හැඳින්වූ බවත් නොපෙනේ. වෙන්නප්පුව අවට ඇති ගම් කීපයක නම් ලංකා ඉතිහාසය සම්බන්ධ නොයෙකුත් ලිපි ලේඛන හා සන්නස්පත්‍රවල සඳහන් වී තිබෙතත් අලගියවන්න මොහොට්ටාල (ක්‍රි.ව 1593 -1615) සම්පාදනය කළ තෝම්බුවේ 'නීලකරාව' ගෝත්‍රය ගැන කියවෙනු තැන ඇති වෙන්නපුව ගැන සුළු සඳහන හැරුණු විට ලංකාවේ ඉංග්‍රීසි යුගය වෙනතුරුම කිසිම ඉතිහාසකරුවකුගේ හෝ වියතෙකුගේ ලිපි ලේඛනවල වෙන්නප්පුව ගැන කිසිම සඳහනක් නැත. කලින් කළ වන්නියාර්පුර,වෙණුපුර ,වර්ණපුර ,වෙන්නත්තිල යන නම් වලින් හැඳින්වූ මේ ගම වෙන්නප්පුව නමින් ලියාපදිංචි වී ඇත්තේ ක්‍රි.ව 1826 දී ඉංග්‍රීසීන් විසින් ජන ලේඛනය ගන්නා අවස්ථාවේදීය.

# වෙන්නප්පුව ජනාවාස වූ අයුරු

vi වැනි පරාක්‍රමබාහු (1415- 1467) අවධියේදී පුත්තලම - හලාවත ප්‍රදේශ මුක්කර නම් කොල්ලකාරයයින්ගේ ග්‍රහණයට හා පීඩනයට හසුවූ බවද රජතුමා ඉන්දීය කුලී හමුදාවන්ගේ සහාය ඇතිව වයඹ ප්‍රදේශයේ ඔවුන්ගේ ග්‍රහණයෙන් බේරාගත් බවද වැලිගම ශ්‍රී සුමංගල හිමියන්ගේ ඉතිහාස පොතෙන් හෙළි වේ. වේලක්කාර නොහොත් අගම්පඩි සේනා වශයෙන් නම් කෙරුණු මෙම බටයෝ ඉන්දියාවෙන් ගෙන්වා ගනු ලැබූ සූර්යය හා චන්ද්‍ර වංශිකයෝ වූහ .අර්සකුලසූරිය, කුරුකුලසූරිය, වර්ණකුලසූරිය ආදී අධිපතීන්ගෙන් යුත් කෞර්ව වංශික සේනාපතියෝ වයඹ දිග මුහුදුබඩ ප්‍රදේශ ආරක්ෂා කළෝය. මෙම පිරිස සින්දාත්‍රිය වයික්කාල අංගම්පිටිය ආදී කොටගෙන ප්‍රදේශය පුරා ව්‍යාප්තව එම ප්‍රදේශයන්හි පදිංචි වූහ. මුලින් ආ කෞරව අධිපතීන්ගේ ඥාතීහු ද විටින් විට මේ ප්‍රදේශයන්ට සංක්‍රමණය වූහ.

මෙසේ ලංකාවේ.බටහිර හා වයඹ දිග ප්‍රදේශවල ජනාවාස ඇති කරගත් කෞරව වංශය පිළිබඳව ‘කුරුකුල චරිතය‘ හා ‘කෞරව වංශය‘ යන පොත් වලින් කරුණු හෙළිදරව්වේ. එහි කෞරව පෙළපත් නාම 24 ක් වශයෙන් නැවත ද මෙසේ පෙළ ගන්වයි.

1.ආරච්චිගේ
2.කංකානමගේ
3. කපූගේ
4.ගලප්පත්තිගේ
5. ගුරුන්නාන්සේලාගේ
6 .ගුරුගේ
7.තන්ත්‍රිගේ
8.තෙල්ගේ
9.තුප්පහිගේ
10.දේවගේ
11.පටබැඳිගේ
12.බදූගේ
13.මරක්කලගේ
14.මණ්ඩිගේ
15.මෙරෙඤ්ඤගේ
16.මෛත්‍රිගේ
17.ලියනගේ
18.වඩුගේ
19.වර්ණගේ

20.විදානගේ/විතානගේ
21.වත්තගේ
22.සට්ටබිගේ
23.හැන්නැදිගේ
24.හේවාගේ
ආදී ඉහත ආකාරාදී පිළිවෙලින් සැකසුණු පෙළත් නාම නානාවිධ කාර්යයන් හෝ රාජකාරී හෝ සේවාවන් අරමුණු කරගෙන පුරාණය පටන් ඇති වූ ඒවාය.

1153 පමණේදී වෙන්නප්පුව පදිංචි වූ කුරුණෑගල ,ගල්ගමුව හා කුරු කෝරලයෙන් පැමිණි සිංහලයන්ද කෞරව වංශිකයන් බව බොහෝ දෙනාගේ මතයයි. ඒ සිංහලයන් සමග මෙසේ වරින් වර පැමිණි කෞවරයන්ද සම්මිශ්‍ර වූවාට සැක නැත. කෞරව වංශය ගැන මෙවන් විස්තරාත්මක සඳහනක යෙදුණේ ජාති ,වංශ ,කුල, ආගම්, උඩපාත වශයෙන් රටේ ඇති භේද හා බෙදීම් අපද අනුමත කරන නිසා නොව වෙන්නප්පුවේ පදිංචිකාරයන් ඉතිහාසයට සම්බන්ධ කිරීමේදී ඇතිවන අසීරුකම්වලින් හා ගැටලුවලින් මිදීම සඳහා බව කියනු කැමැත්තෙමු.

සැබවින්ම කුල ගෝත්‍ර පසෙක තබා ලංකා සිංහල දෙමළ එකම මූලයක එකම පිරිසක් එකම වර්ගයක් හැටියට පිළිගන්නට තරම් අප තුළ එකඟතාවක් ඇති වූවහොත් අද පවතින ජාති භේදය බින්න වී යනවා පමණක් නොව වෙන්නප්පුව ජනතාව අතරද කිසිම භේදයක් මොනම තැනකින්වත් ඇතිවීමට ඉඩක් ද නැතිවේ.

ඓතිහාසික ලිපි ලේඛන මත කෙලින්ම සනාථ කළ නොහැකි වුවද වෙන්නප්පුවේ උරුමකාරයන් ගැන සොයා බැලීමේදී අපට අසා දැනගන්නට ලැබුණු කරුණු මෙහිලා ලුහුඬින් දක්වනු කැමැත්තෙමු.

ඉංග්‍රීසින් ලංකාව අල්ලා ගත් බව ආරංචි වූ සැණෙකින්ම මෙතෙක් උඩරට රජ යටතේ සේවයේ යෙදී සිටි මෙහි විසූ වන්නියාර් ගමෙන් පලා ගොස් ඇත ඔහුගේ දෙවැන්නා වශයෙන් සේවය කළ මහ ලේකම් මීට ටික දිනකට මියගොස්ය. එම මහ ලේකම්ගේ වැන්දඹු බිරිඳ, දූන් පස්දෙනා හා බාලම පුතාද මහලේකම් ගෙදර සිටියෝය. මේ පවුල ගමේ සිටි අනෙකුත් අයවලුන් අතර කැපී පෙනුනා පමණක් නොව ඔවුන්ගේ ගෞරවයටද පාත්‍ර විය.

පසු කලෙක රත්ගමින් මෙහි පැමිණි සාමෙල් සිරිවර්ධන, බිංගිරිය කළුගමින් පැමිණි එම ගම් දෙටුවාගේ පුත්‍රයා ,උඩුගම්පලින් පැමිණි උඩුගම්පල තරුණයා ,බැල්ලරාවෙන් පැමිණි පොන්පේරු ( රන්පෙරන්නා) ගේ පුත්‍රයා යන අය මහලේකම් පවුලේ වැඩිමහල් දූවරුන් සතර දෙනා පිළිවලින් විවාහ කරගත්හ. බාලම දියණිය මෙහිම විසූ වීර කොණ්ඩ ආරච්චි පවුලේ කෙනෙකු සමග ආවාහ වූවාය.(මෙහි බාල දියණිය, ඥාති දියණියයි ඇතැම් අය පවසති.) මේ වන විටත් මහලේකම් පවුලේ එකම පිරිමියා වගකීම් බාර දිය නොහැකි තරම් බාල වියේ පසුවූ බැවින් පවුලේ මූලිකයා හැටියට කටයුතු කළේ වැඩිමල් දියණිය සරණ පාවාගත් රත්ගමයා හෙවත් සාමෙල් සිරිවර්ධනය.

# වෙන්නප්පුව ප්‍ර දේශයේ පෙළපත් නාම පටබැඳීම

නම් ලියාපදිංචියේදී රත්ගමින් පැමිණි තරුණයා රතුගමගේ නමින්ද ,කළුගමින් පැමිණි තරුණයා කළුගමගේ යන්න නමින්ද ,උඩුගම්වලින් පැමිණි තරුණයා උඩුගම්පලගේ නමින්ද, වැල්ලරාවෙන් පැමිණි තරුණයා යන අර්ථවත් පොන්නම්පෙරුම යන නමින්ද,මහ ලේකම්ගේ පුත්‍රයා මහලේකම් නමින්ද ,තමන් රිසි පරිදි කුලවන්නම් ලබා ගත්හ.

බාල දියණිය ආවාහ වූ වීර කොණ්ඩ ආරච්චි එම පෙළපත් නමින්ද, දෙවැනි පරම්පරාවේදී මහ ලේකම් පවුලට බැඳුණු මහතෙල් පෙළපත ද තම පෙළපත් නාම නොවෙනස්ව ඉදිරියට ගෙන ගියෝය.
දෙවැනි හා තුන්වන අවස්ථාවලදී වෙන්නප්පුවේ පදිංචියට ආ ඇතැම් අය ද මෙහිදී තමා උපන් ගම අනුව නාම සකස් කරගත් බව පෙනේ. ඇතමෙක් තමන්ගේ නියම පෙළපත් නාම හා පෞද්ගලික නාම එසේම භාවිතා කළෝය.

ගාල්ලගේ ,දෙහිවලගේ, කොළඹගේ, කටුනෑකගෙ, මිරිස්සගේ,පෝරු තොටගේ ආදී පෙළපත් නාම ගම් මුල් කරගෙන ඇති වූ ඒවාය. ජයසිංහ ආරච්චිගේ, කුට්ටික කානමගේ, ජයසූරිය කුරණගේ, ඥාණ කංකානමගේ, කළුතර කංකානමලාගේ යන ආදී පෙළපත් නාම ගමක් පෙළපතත් හෝ තනතුර එකට සවිකර ගැනීමකි.

වෙන්නප්පුව නින්දගම්කල පවුල් හත ප්‍රතිකාල් ක්‍රමය අනුව නාමයන් අගට 'ප්‍රනාන්දු' කුලවන්නම සමග කතෝලිකයන් බවට පත්වී ඇත්තේ තුන්වන පරම්පරාවේදීය.

වෙන්නප්පුවේ සතර වැනි පරම්පරාවේදී කළුගම.මහතෙල්, මහ ලේකම් යන පෙළපත් නාම වලට පෙරටුව වර්ණකුලසූරිය යන අභිදානය එකතුකර ඇත.

## වේණුපුර සන්නස


මෙම සන්නසට අනුව ගිංඔය යුරින් පටන්ගෙන මහ මුහුදේ ඇත්සොඬෙක් පොව්වන ගැඹුර දක්වා නැගෙනහිර දෙසත්, බටහිර දෙසත් මායිම් කොට උතුරු කැලයෙන් කටුනේරියත්,දකුණු කැලයෙන් දුම්මලදෙනියත් වෙන් කරන කඩඉම් උතුර දකුණු මායිම් කොට, වේණුපුර (වෙන්නප්පුව) ගම පවරා දුන් බව සඳහන් වෙයි.

## උරුමය බෙදා ගැනීම

ඉහත කී සන්නසෙහි අයිතිය වන වෙන්නප්පුව නින්ද ගමේ වගා කෙරුණු ගොඩ ඉඩම් හා වෙල්යාය හිත් හෝදිසිය අනුව කොටස් හතරකට බෙදන ලදි. මෙම කොටස් හත මහ ලේකම්, රතුගම, කළුගම, උඩුගම්පල, පොන්නම්පෙරුම, වීර කොණ්ඩ ආරච්චි,මහතෙල් (දෙවැනි පරම්පරාවේ විවාහ සම්බන්ධකම් මත) යන උරුමකාරයන් හත් දෙනාට අයිති විය. අද ගමේ පාරවල් අනුව ඉහත කී උරුමය කොටස් දළ වශයෙන් දක්වකොත් සීමාවන්

මෙසේ ය. නුගගහ මුල්ලේ සිට කඩවත පාර දක්වා උතුරු සීමාව පොන්නම් පෙරුමගේ පෙළපතට ද, කඩවත පාරේ සිට හෙළන් මාවත දක්වා නැගෙනහිර සිට බටහිරට බිම් කොටස කළුගමගේ පෙළපතට ද, හෙළන් මාවතේ සිට තෝමස් ප්‍රනාන්දු මාවත දක්වා නැගෙනහිරේ සිට බටහිර දෙසට විහිදෙන බිම් තීරුව උඩුගම්පලගේ පෙළපතට ද,වාල්ස් විලියම් මාවතින් දකුණට විහිදී යන වැව ආශ්‍රිතය ප්‍රදේශය මහ ලේකම් පූතාටද, තෝමස් ප්‍රනාන්දු මාවතේ සිට ෆ්‍රැන්සිස් සේවියර් මාවත දක්වා අලුත් පාර මායිම් කර එම බිම් තීරුව රතුගමගේ පෙළපතට ද, වැව ආශ්‍රිත උතුරු කොටස වීරකොණ්ඩ ආරච්චි පෙළපතටද අයිති වන ලෙස බෙදා වෙන් වෙන්කර ගත්හ.

මේ අතර පොන්නම්පෙරුමගේ හා රතුගමගේ පවුල් දෙකට මෙම බිම් කොටස් බෙදීමේදී අඩුවක් පෙනී ගියත් පසුව ඇති කරගත් සම්මුතියක් අනුව පොන්නපෙරුමගේ පවුලට දැන් ලුණුවිල හන්දිය යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයෙනුත් ,රතුගමගේ පවුලට හෙළන් මාවත ප්‍රදේශයෙනුත් බිම් කොටස් දුන් බව කියවේ. කෙසේ නමුත් අක්කර 1600 (එක්දහස් හයසීයක්) පමණ බිම් ප්‍රදේශය පවුල් අතර බෙදා ගැනීම ඉතා සාමකාමීව සිදුවී ඇති බව කිව හැක.





LEGEND
WEN_GND_CLIP
GND_N

| | | |
|---|---|---|
| Aluttota | Ihala Bujjampola | Mirissankotuwa North |
| Angampitiya East | Ihala Dummalakotuwa | Mirissankotuwa South |
| Angampitiya West | Ihala Mohottimulla | Morukkuliya |
| Bandirippuwa East | Jankurawela | Motemulla |
| Bandirippuwa North | Kadawatha | Nainamadama East |
| Bandirippuwa West | Kahatavila East | Nainamadama West |
| Bolana | Kahatavila West | Pahala Bujjampola |
| Bolawatta | Kaluwachchimulla | Pahala Dummalakotuwa |
| Boralessa East | Kammala | Pahala Mohottimulla |
| Boralessa North | Katukenda East | Pansal Handiya |
| Boralessa South | Katukenda West | Pothuwatawana |
| Boralessa West | Kirimetiyana East | Rangammulla |
| Bothalegama | Kirimetiyana North | Sendiriyamulla |
| Dankotuwa East | Kirimetiyana South | Sindathriya |
| Dankotuwa North | Kirimetiyana West | Singakkuliya |
| Dankotuwa South | Kolinjadiya East | Sirigampala North |
| Dankotuwa West | Kolinjadiya North | Sirigampola South |
| Dikwela | Kolinjadiya South | Thamarakuliya |
| Dummaladeniya East | Kolinjadiya West | Thambarawila |
| Dummaladeniya North | Lihiriyagama | Thopputhota |
| Dummaladeniya South | Lunuvila East | Thulawala |
| Dummaladeniya West | Lunuwila South | Udasirigama |
| Etiyawala North | Lunuwila West | Ulhitiyawa North |
| Etiyawala South | Meda Dummaladeniya | Ulhitiyawa South |
| Godella | Meda Gonavila | Ulhitiyawa West |
| Gonavila North | Meda Haldanduwana | Waikkala North |
| Gonavila South | Meda Katukenda | Waikkala South |
| Haldanduwana North | Meda Kirimetiyana | Wellamankaraya |
| Haldanduwana South | Meda Lunuwila | Wennappuwa East |
| Haldanduwana West | Meda Nainamadama | Wennappuwa North |
| Hanathotupola | Meda Ulhitiyawa | Wennappuwa South |
| Hundirapola | Meda Wennappuwa | Wennappuwa West |
| | Mellawa | Yogiyana |
| | Metikotuwa | |

SOURCE :- GOOGLE SATELLITE MAP
DESIGNED :- DOLG GIS UNIT - NWP
DATE :- 2024/02/22

# Divisional Map of Wennappuwa Pradeshiya Sabha Area



## යටිතල පහසුකම් විස්තරය

- **මාර්ග විස්තරය**

| | | ප්‍රමාණය | දුර |
|---|---|---|---|
| 01. මුළු මාර්ග සංඛයාව | - | 4035 | **(945.35 KM)** |
| 02. මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග සංඛ්‍යාව (RDA) | – | 06 | **(43.57 KM)** |
| 03. පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සතු මාර්ග සංඛ්‍යාව (PRDD) | – | 47 | (116.83 KM) |
| 04. ප්‍රාදේශීය සභාව සතු මාර්ග සංඛ්‍යාව (PS) | – | 3902 | **(780.41 KM)** |
| 05. පුද්ගලික මාර්ග සංඛ්‍යාව (PVT) | – | 80 | **(4.54 KM)** |

- **මතුපිට තලය අනුව ප්‍රාදේශීය සභා සතු මාර්ග වර්ගීකරණය**

| | | ප්‍රමාණය | දුර |
|---|---|---|---|
| **01.** තාර ප්‍රමාණය | - | **1711** | **(450.47 KM)** |
| **02.** කාපට් ප්‍රමාණය | - | **74** | **(166.30 KM)** |
| **03.** කැටගල් ප්‍රමාණය | - | **83** | **(21.69 KM)** |
| **04.** බොරළු ප්‍රමාණය | - | **1703** | **(184.40 KM)** |
| **05.** කොන්ක්‍රීට් ප්‍රමාණය | - | **464** | **(122.49 KM)** |

## මාර්ග ලේඛනය ලබා ගැනීම සඳහා


SCAN ME
Road Gazette 01

SCAN ME
Road Gazette 02

SCAN ME
Road Gazette 03

SCAN ME
Road Gazette 04

# ROAD NETWORK IN WENNAPPUWA PS AREA




Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23

- මාර්ග ජාලය තුළ ඇති අනෙකුත් විස්තරය

| | | |
|---|---|---|
| 01. වීදි ලාම්පු ප්‍රමාණය | - | 17550 |
| 01. බෝක්කු ප්‍රමාණය | - | 798 |
| 02. පාලම් ප්‍රමාණය | - | 05 |
| 03. කැලවිලි ප්‍රමාණය | - | 03 |
| 04. පැකිබැම් ප්‍රමාණය | - | 11 |
| 05. කාණු පද්ධති ප්‍රමාණය | - | 27 |


<u>ලේඛන ලබා ගැනීම සඳහා</u>

01.කාණු පද්ධති ප්‍රමාණය

02. වීදි ලාම්පු ප්‍රමාණය


03.පාලම් බෝක්කු ප්‍රමාණය

# STREET LAMP DISTRIBUTION IN WENNAPPUWA PS AREA





SOURCE : GOOGLE SATTELITE IMAGE & GPS TRACKING
DESIGNED BY : GIS UNIT NWP & WENNAPPUWA PS
DATE : 2024.02.23

# CULVERT OF WENNAPPUWA PS AREA



# DRAIN SYSTEM OF WENNAPPUWA PS AREA




SOURCE :- GOOGLE SATELLITE HYBRID & GPS TRACKING
DESIGNED :- DOLG GIS UNIT
DATE :- 2024/02/24

# <u>දියුණු කළ ප්‍රදේශ</u>

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දියුණු කළ ප්‍රදේශ 04 ක් ප්‍රකාශයට පත්කර ඇති අතර, එම කොට්ඨාශ පහත පරිදි වේ.

1. වෙන්නප්පුව
2. කම්මල්පත්තුව
3. දංකොටුව
4. කිරිමැටියාන


මෙම සියළු කොට්ඨාශ වල වරිපනම් බදු ගෙවන ඒකක සංඛ්‍යාව 16114 ක් වන අතර ඒ තුළින් ප්‍රාදේශීය සභාවට වාර්ෂිකව ලැබෙන ආදායම රුපියල් 19822000.00 වේ.


දියුණුකළ ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීමේ ගැසට් නිවේදන


SCAN ME

Assessment tax zone Gazette

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කම්මල්පත්තුව සංවර්ධන ප්‍රදේශ





වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ
වෙන්නප්පුව සංවර්ධන ප්‍රදේශ
N
wennappuwa - lunuwila road
Chilaw-Colombo road
wennappuwa lake
wennappuwa lake
Canel
සිතියම
පාර
මාර්ග සංවර්ධන අධිකාරිය
පළාත් මාර්ග
ප්‍රාදේශීය සභා මාර්ගය
ප්‍රධාන මාර්ගය
සම්බන්ධීකරණය
ගොඩනැගිල්ල
වැව
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 13.3 km
ප්‍රදේශය - 8.30 km²
40000 0 40000 80000 120000 km
source-Google satelitte image and GPS tracking /desined by DOLG GIS Group ( Shamira )




වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ
දංකොටුව සංවර්ධන ප්‍රදේශ
N
සිතියම
සම්බන්ධීකරණය
ජල මූලාශ්‍ර
ඇල
ගඟ
ජලාශ
පාර
පළාත් මාර්ගය
ප්‍රාදේශීය සභාව
මාර්ග සංවර්ධන අධිකාරිය
ගොඩනැගිලි
ප්‍රධාන මාර්ගය
A නාත්තන්ඩිය
B මීගමුව
C පන්නල
ප්‍රමාණය
වර්ග ප්‍රමාණය - 26.6 km
ප්‍රදේශය - 20.1 km²
A
B
C
500 0 500 1000 1500 2000 m
Source: Google Satellite Images & GPS Tracking System
Desinged By: DOLG, Wennappuwa Pradeshiya Sabha & P.P.D.D.S. Serasinghe

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කිරිමැටියාන සංවර්ධන ප්‍රදේශ




**Data Source : Google Satalite images & GPS Tracking System**
**Designed by : W.G.A.B. Madusankha & Wennappuwa PS**

# BUILDING DISTRIBUTION IN WENNAPPUWA PS AREA




Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23

# ජනගහනය

- දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

01.මුළු ජනගහනය - 67079

02.ස්ත්‍රී ජනගහනය - 35225

03.පුරුෂ ජනගහනය - 31854

වයස් කාණ්ඩය අනුව ජනගහනය

| වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ | ඒකතුව |
|---|---|---|---|
| අවු. 0-5 | 2152 | 2007 | 4159 |
| අවු. 6-10 | 2543 | 2197 | 4740 |
| අවු. 11-16 | 2649 | 2478 | 5127 |
| අවු. 17-19 | 1164 | 1089 | 2253 |
| අවු. 20-25 | 2750 | 2765 | 5515 |
| අවු. 26 -30 | 2397 | 2388 | 4785 |
| අවු. 31-60 | 15183 | 14425 | 29608 |
| අවු. 60 ට වැඩි | 6358 | 4534 | 10892 |
| එකතුව | 35196 | 31883 | 67079 |

- වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

01.මුළු ජනගහනය - 82791

02.ස්ත්‍රී ජනගහනය - 43597

03.පුරුෂ ජනගහනය - 39194


වයස් කාණ්ඩය අනුව ජනගහනය

| වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ | ඒකතුව |
|---|---|---|---|
| අවු. 0-5 | 2382 | 2109 | 4491 |
| අවු. 6-10 | 3189 | 2905 | 6094 |
| අවු. 11-16 | 3745 | 3402 | 7147 |
| අවු. 17-19 | 2159 | 2027 | 4186 |
| අවු. 20-25 | 3444 | 3331 | 6775 |
| අවු. 26 -30 | 3616 | 3312 | 6928 |
| අවු. 31-60 | 17911 | 16803 | 34714 |
| අවු. 60 ට වැඩි | 7151 | 5305 | 12456 |
| එකතුව | 43597 | 39194 | 82791 |

- මුළු ජනගහනය - 149870


<u>ජනගහන ලේඛනය ලබා ගැනීම සඳහා</u>

# POPULATION DENSITY IN WENNAPPUWA PS AREA





Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23

# POPULATION OF WENNAPPUWA DSD AREA





# RELIGIOUS PLACES DISTRIBUTION IN WENNAPPUWA PS AREA




Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23

# SCHOOLS OF WENNAPPUWA PS AREA




WATER SOURCE DISTRIBUTION IN WENNAPPUWA PS AREA
Legend
Water_Source
BASELINE
N
KM
0
0.5
1
2
3
4
93000
96000
99000
102000
105000
108000
111000
230000
232000
234000
236000
238000
240000
242000
SCAN ME
Source: Google Satallite images & Wennapuwa ps
Designed by : GIS UNIT NWP & Wennapuwa PS
Date : 2024.02.23

# ගිං ඔය

සැතපුම් ගණනක් දුර ගෙවමින් දෙමටපිටිය ප්‍රදේශයෙන් බලප්‍රදේශයට පිවිශ්ය වන ගිං ඔය කොමළිය ඇගේ ගමන නිමා කරමින් මුහුදට එක්වීමට ආසන්නම ප්‍රදේශය වන බැවින් වෙන්නප්පුව බල ප්‍රදේශය හරහා වෙහෙසකර වූ ඉතා සෙමින් ගමනක යෙදේ. අර්ධ නාගරික ප්‍රදේශයක් වන වෙන්නප්පුව බල ප්‍රදේශයේ පවත්නා අධික උෂ්ණුසුමට ඇගේ ගමන ස්වභාවික සිසිලසක් ගෙන දෙනු ලබයි. නයිනමඩම,රංගම්මුල්ල ප්‍රදේශ පසුකර සින්දාත්ත්‍රිය ප්‍රදේශයෙන් ඇය ඇගේ ගමන නිමා කරයි. ගිං ඔයට අයත් ජල ධාරා ප්‍රදේශ එතරම් විශාල නොවේ. එබැවින් වැසිකාල වලදී හැර අනෙකුත් කාල වලදී ප්‍රබල දිය පහරක් මෙයින් ගලා නොයන අතර, මෙම නිසා වඩ දිය හා බා දිය මඟින් මෙම ජල වහනයට විශාල බලපෑමක් කරනු ලබයි.

ගිං ඔය සඳහා වෙල්ලමංකරය හා කම්මල් මෝය නමින් මෝය දෙක හිමිය පැරණි ක්‍රමය අනුව ගිං ඔයේ ජලය මුහුදට ගලා බැස්සේ කම්මල මෝය තුළින් මා ඔයට සම්බන්ධ වීමෙනි. එහිදී ස්වභාවිකව ඇති වන වැලිතලාව කැපීමෙන් හෝ මා ඔයේ හා ගිං ඔයේ ප්‍රබල ජල පීඩනය මඟින් බිඳී යාමෙන් හෝ කම්මල් මෝය ක්‍රියාත්මක විය නමුත් වර්තමානයේ දී කම්මල් මෝය අක්‍රීය තත්ත්වයට පත්ව ඇත. වර්ෂා කාලයේදී මා ඔයේ සහ ගිං ඔයේ ජල මට්ටම ඉහළ යන විට යම් පිරිස් විසින් කම්මල් මෝය නොකපා මා ඔය මෝය කපා ජලය මුහුදට මුදා හැරීම මෙයට හේතුවයි. තවද ගිං ඔයේ ජලය සාළියන්කුලම ඇළ මාර්ගය ඔස්සේ මා ඔයට බැසයාම නිසා කම්මල මෝය බිඳී යාමට තරම් විශාල ජල පීඩනයක් ඇති නොවීමද මෙයට හේතු කාරක වේ.

## ගිං පොල්

ගිං ඔය සහ මාදු ගඟ දෙපස බහුල ලෙස දැකිය හැකි මෙම ශාක වර්ගය ශ්‍රී ලංකාවේ කඩොලාන ශාක අතරින් තාල වර්ගයට අයත් එකම ශාක වර්ගයද වේ. අඩි 12 පමණ උසැති ගිං පොල් ශාකයේ කොළය නාරටියෙන් දික් වී පොල් අත්තක හැඩය ගනී. සැරසිලි සඳහා මෙම අතු සහ ගෙඩි ප්‍රයෝජනයට ගන්නා අතර, ගිං පොල් මදය රසවත් ආහාරයක් වේ. ගිං පොල් වල වතුරද රසවත්ය. එමෙන්ම මී රා කර්මාන්තයටද මෙය ප්‍රයෝජනවත් වේ ගිං පොල් ශාකය කකුළුවන් මත්ස්‍යයින්ගේ ජීවන චක්‍ර ක්‍රියාවලියට උපකාරී වේ.

## ගිං ඔයේ ශාක ප්‍රජාව

ගිං ඔය මුහුදට වැටීමට ආසන්න ප්‍රදේශය වෙන්නප්පුව බලප්‍රදේශය බැවින්, එහි දෙපස ඇති ශාක කඩොලාන ශාක විශේෂයෙන් යුක්ත වේ.එම ශාක විශේෂ 22 ක් පමණ ඇති අතර, ලංකාවට ආවේනික වූ විශේෂ 12 ක් දක්වට ඇත. එනම් ,

- ගිං පොල්
- මන්ද කටු
- මහකඩු
- මල් කඩොල්
- කිරළ
- තෙල
- කැරන් කොකු
- කටු ඉකිලි
- ඇගියුලාව
- ඇටිසිනියා

මේ අතර වේ.


## <u>ගිං ඔයේ ජීවත් වන මත්ස්‍ය ප්‍රජාව</u>

- ආඳා
- මඩකනයා
- පෙතියා
- ලූලා
- අයිරාව
- කොරළි
- හුංගා
- කොළකනයා
- මඟුරා
- ඉස්සා
- කකුළුවන් වර්ග


(මිරිදිය මසුන් විශේෂ 20 ට වැඩි සංඛ්‍යාවක් මෙහි ජීවත්වේ )

# CLIMATE DEATAILS OF WENNAPPUWA PRADESHIYA SABHA AREA


N





JANUARY





FEBRAVERY





MARCH




APRIAL





MAY





JUNE

SOURCE : https://www.ventusky.com/?p=8.03;82.61;6&l=rain-3h&t=20231215/0600
DESIGNED : DOLG GIS UNIT


# CLIMATE DEATAILS OF WENNAPPUWA PRADESHIYA SABHA AREA





JULY





AUGUHT





SEPTEMBER




OCTOMBER





NOVEMBER





DECEMBER

SOURCE :
https://www.ventusky.com/?p=8.27;80.88;6&l=temperature-2
DESIGNED : DOLG GIS UNIT

# BUSINESS PLACE OF WENNAPPUWA PS AREA



# PLACES OF GOVERNMENT ADMINISTRATION IN WENNAPPUWA PS AREA



වයඹ අභිමානය




# ස්තූතියි

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ අභිමානය